තමා ජීවත්වන ලෝකය ගැන සැබෑ උනන්දුවක් දක්වන අයට මතු නොව පොදුවේ අප කාටත් මෙන්ම විශේෂයෙන්ම උසස් අධ්‍යාපනයට යොමු වූ සිසුනට ද මෙහි ජනනය කර ඇති නව දැනුම බෙහෙවින් ප්‍රයෝජනවත් වනු නොඅනුමානය.

ආචාර්ය ටිම් ෆ්ලැනරි විශ්ව කීර්තියක් ඇති ජීව විද්‍යාඥයෙකි. ජිවි විශේෂ 34 කට අධික සංඛ්‍යාවක් සොයා නම් කල ඔහු 2007 වර්ෂයේ විශිෂ්ඨතම ඔස්ට්‍රේලියානු ජාතිකයා වශයෙන්ද පුද ලැබුවේය. දකුණු ඔස්ට්‍රේලියානු කෞතුකාගාරයේද වනසත්ව සංරක්ෂණ ආයතනයේද අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කල ආචාර්ය ෆ්ලැනරි කලක් හාවඩ් විශ්ව විද්‍යාලයේ ඔස්ට්‍රේලියානු අධ්‍යයන පිළිබඳ මහාචාර්ය ධුරයද හෙබවීය. පරිසර පද්ධතීන් හා ජීව විද්‍යාත්මක ගවේෂණ පිළිබඳව පොත් දහයක් ලියා පළකර ඇති ආචාර්ය ෆ්ලැනරිගේ **We are the weather makers** නැමැති මේ කෘතිය ගෝලීය උණුසුම නිසා ජීවිගෝලයට ඇතිවිය හැකි විෂම බලපෑම හා ඉන් අත්මිදීමට ඇති හැකියාව ගැන පළ කර ඇති පොත් අතුරින් අසම සම කෘතියක් වශයෙන් සැලකෙයි.

විජයානන්ද ජයවීර පරිවර්තන සාහිත්‍ය සඳහා රාජ්‍ය සාහිත්‍ය සම්මානය ලැබූ ලේඛකයෙකි. එංගලන්තයේ ලෙස්ටර් විශ්ව විද්‍යාලයෙන් සංනිවේදන වේදය පිළිබඳව ශ්‍රාස්ත්‍රපති උපාධිය ලබා ඇති ජයවීර දියුණුවෙන රටවල ජනමාධ්‍යය සංවර්ධනය පිළිබඳ පැරිසියේ පිහිටි යුනෙස්කෝ ( **UNESCO)** ජාත්‍යන්තර වැඩසටනේ අධ්‍යක්ෂකවරයා වශයෙන් කටයුතු කරයි.

ISBN: 978-955-51142-0-2

w.jayaweera@wanadoo.fr